පරිශීලක අත්පොත

ව්‍යාපාර කටයුතුවලදී දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම

(BBCR) පිළිබඳ මෙවලම

NCF
Nordic Climate Facility
Initiative by NDF

UNEP DTU PARTNERSHIP

adpc

The Ceylon Chamber of Commerce

MP ENSYSTEMS

1. BBCR මෙවලම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

ව්‍යාපාර කටයුතුවල නිරතවීමේ දී දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම පිළිබඳ (BBCR) මෙවලම හඳුන්වාදීමේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික හිමිකරුවන්ට ජල ගැලීම් සිදු වන අවස්ථාවලට මුහුණදීම සඳහා සූදානම්වීම සඳහාත් සිය ව්‍යාපාරවලට සිදු වන අහිතකර බලපෑම අවම කිරීම සඳහාත් ඔවුන් සතු හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් එම ව්‍යාපාරික හිමිකරුවන්ට සරල මෙන්ම පහසුවෙන් ප්‍රවේශ විය හැකි උපදෙස් හා නිර්දේශ සපයා දීමයි.

දැනට පරිශීලකයාට උපයෝගී කර ගත හැකි මෙම යෙදවුමේ මූලික කරුණු පහත පරිදි වේ :

- **පවත්නා වර්ෂාපතන මට්ටම් ලබා ගැනීම සඳහා වන වර්ෂා සිතියම (Rain Map with Live Rainfall Level Tracking) :** තම ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ප්‍රදේශය ආශ්‍රිතව ජල ගැලීමක් ඇති වීමට තිබෙන ඉඩ කඩ පිළිබඳව සොයා බැලීම සඳහා පරිශීලකයා විසින් වර්ෂා දත්ත ලබා දේ. තම ව්‍යාපාර ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය මූලික ආරක්ෂිත පියවර ගැනීම සඳහා ව්‍යාපාරිකයන්ට අවස්ථාවල ලබා දෙමින් ඔවුන් වෙත සපයනු ලබන්නා වූ කල් තියා අනතුරු ඇඟවීම් පද්ධතික් ලෙස මෙය සැලකිය හැකිය.
- **සකස් කරනු ලබන නිර්දේශ (Tailored Recommendations):** තම ව්‍යාපාරය පිළිබඳ තොරතුරු රහස්‍යභාවය සුරැකෙන ආකාරයෙන්, සුරක්ෂිත අවකාශයක් තුල ලබා දීම තුලින් ජල ගැලීම සිදු වන අවස්ථාවේ දී තම ව්‍යාපාරයට මුහුණ පෑමට සිදු විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහාත් පෙර සූදානම් වර්ධනය කර ගැනීම සඳහාත් අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට පරිශිලකයාට හැකි වේ.
- BBCR මෙවලමෙහි මෙම නව වෙළුම පරීක්ෂණ මට්ටමේ වෙළුමක් වශයෙන් දියත් කර ඇති බව පරිශීලකයන් විසින් කාරුණිකව අවබෝධ කර ගත යුතුය. මෙම පරීක්ෂණ අවධිය තුල ලබා දෙන ප්‍රතිපෝෂණ සැලකිල්ලට ගනිමින් මෙම යෙදවුම නවීකරණය කර අවසන් ඵලයක් ලෙස නිකුත් කරනු ලැබේ. - මෙම මෙවලම භාවිතය සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා අත්දැකීම් ලබා ගැනීමට අපි ඉතා කැමැත්තෙන් හා ඕනෑකමින් පසුවෙමු.!

2. මෙවලම් මගින් ඔබගේ ව්‍යාපාරය සඳහා ලබා ගත හැකි වාසි මොනවා ද?

මෙම යෙදවුම (app) භාවිතා කිරීමේ දී පරිශීලකයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පහත දැක්වෙන රූප සටහන තුලින් නිරූපණය කර දැක්වේ.

කුඩා පරිමාණයේ ව්‍යාපාර සඳහා නිපදවන ලද නව යෙදවුමක් (app) පිළිබඳව ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (CCC) මගින් සුනිල්ට දැනගන්නට ලැබෙන අතර එම උපකරණය පිළිබඳව වැඩි දුර තොරතුරු ලබා ගැනීමට සුනිල් තුල උනන්දුවක් ඇති වේ.

එම යෙදවුම (app) බාගත කර ගැනීමෙන් අනතුරුව වෙනත් ව්‍යාපාර පිළිබඳව රජය මගින් වර්ෂා දත්ත පළ කරන බව සුනිල්ට පෙනී යයි. සුනිල් විසින් ගම්පහ ප්‍රදේශයේ පවත්වාගෙන යන සුනිල්ගේ ව්‍යාපාරයට ඇති විය හැකි ජල ගැලීම් අවදානම පිළිබඳව එම සිතියම මගින් දළ විශ්ලේෂණයක් සපයයි.

ඇනලොග් වර්ෂාමානයක් ලබා ගෙන එය යෙදවුමෙහි ලියාපදිංචි කර වර්ෂා දත්ත ලබා දීමට සුනිල් තීරණය කරයි.





යෙදවුමෙහි දෙවන කොටසේ දී නිර්දේශ ලබා ගන්න ('Get Recommendations') නමැති බොත්තම ක්ලික් (click) කිරීම තුළින් තම ව්‍යාපාරය සම්බන්ධයෙන් සකස් කළ උපදෙස් ලබා ගැනීමට සුනිල්ට හැකිය.

සුනිල් තම ගොඩනැගිල්ල පිළිබඳවත්, පසුගිය ජලගැලීම් පිළිබඳ අත්දැකීම් සහ තම ව්‍යාපාරයේ තිබන උපකරණ, තොග හා සේවකයින් පිළිබඳවත් කෙටි තක්සේරුවක් ඇතුලත් කරයි.

මෙම යෙදවුම මගින් සුනිල්ට මුහුණ දීමට සිදු විය හැකි අවදානම් තත්ත්වයන් තක්සේරු කරනු ලබන අතර ගත යුතු ප්‍රමුඛ පියවර පිළිබඳව නිර්දේශ සපයයි. වැඩි දුර තොරතුරු ලබා ගැනීම සඳහාත් ණය නිලධාරියකු සම්බන්ධ කර ගැනීම සඳහාත් සුනිල් සම්බන්ධකය (link) ක්ලික් කරයි. ඔවුන් දෙදෙනාගේම

ප්‍රමුඛ ක්‍රියාමාර්ගයට අමතරව සුනිල්ට අවධානය යොමු කළ හැකි වෙනත් නිර්දේශ ද මෙම යෙදවුම මගින් ලබා දේ.





මාස කිහිපයකට පසුව අදාළ ප්‍රදේශයෙහි තද වැසි ඇති වේ. වාර්තා වූ වාර්ෂාපතන මට්ටම් ඉහළ වර්ෂා පතන ධාරිතාවක් ලෙසට යෙදවුමෙහි සටහන් වේ.

සුනිල්ට යෙදවුම හරහා නිවේදන ලැබෙන අතර විශාල වර්ෂාපතනයක් පිළිබඳව යෙදවුමෙහි වාර්තා වී ඇති බව සුනිල්ට පෙනී යයි. තම ව්‍යාපාරය ජල ගැල්මකට හසුවීමට විශාල ඉඩකඩක් පවතින බව පසුගිය අත්දැකීම් අනුව ඔහුට අවබෝධ වේ.

යෙදවුම මගින් දක්වා ඇති නිර්දේශ පිළිබඳව සුනිල් සැලකිලිමත් වන අතර තම භාණ්ඩ රැගෙන ගොස් ගබඩා කර තැබිය හැකි විකල්ප ගබඩා අවකාශයන් කුලී පදනම මත ලබා ගනිමින් ඇති විය හැකි ජලගැල්මට මුහුණ දීමටත් ඇති විය හැකි හානිය අවම කර ගැනීමටත් ඔහු පෙර සූදානමක් ඇති කර ගනී.

3. ආරම්භ කිරීම - ඔබගේ BBCR මෙවලම ස්ථාපිත කර ගැනීම සහ භාවිතයට ගැනීම

3.1 මෙම බීබීසීආර් (BBCR) මෙවලම් යෙදවුම ඔබගේ ඇන්රොයිඩ් හෝ ඇපල් (iOS) ජංගම දුරකථනයට ස්ථාපිත (install) කර ගන්න.

පහත දැක්වෙන QR කේත භාවිතා කරමින් ගූගල් ප්ලේ ස්ටෝර් (GooglePlay Store) වෙතින් මෙම යෙදවුම (app) ඔබට බාගත කර ගත හැක:

තව ද ඇපල්/ අයි දුරකථන (Apple/iPhone) භාවිතා කරන්නන්හට පහත දැක්වෙන QR කේතය භාවිතා කරමින් ඇප් ස්ටෝර් (App Store) වෙතින් මෙම යෙදවුම බාගත කර ගත හැක:

3.2 ඔබගේ පුද්ගලික තොරතුරු ඇතුලත් කරන්න

- අදාළ යෙදවුම සාර්ථකව බා ගත කර ගැනීමෙන් අනතුරුව පහත දැක්වෙන තිරය දක්වමින් එය විවෘත වනු



පළමුවෙන්ම යාවත්කාලීන කළ තොරතුරු (‘Update info’) දැක්වෙන තිරය වෙත පිවිසීම සඳහා දුරකථනයේ ඉහළ දකුණු කෙළවරේ තිබෙන පසුතලය (‘Settings’) ක්ලික් කරන්න. එහි දී ඔබගේ මුල් නම, අවසන් නම, ව්‍යාපාර නාමය ලෙස සලකුණු කර ඇති ක්ෂේත්‍ර සම්පූර්ණ කිරීමට ඔබට හැකි වන අතර ඔබගේ ‘සංවේදක පිහිටීම’ (‘Sensor Location’) එනම් වර්ෂාපතන මට්ටම් පිළිබඳ වාර්තා ලබා දීමට ඔබ අදහස් කරනු ලබන ප්‍රදේශය ද (ව්‍යාපාරික ස්ථානයේ පිහිටීම) දැක්වීමට ඔබට හැකි වේ



- ‘Update info’ යන්න ක්ලික් කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන ආකාරයෙන් ඔබගේ තොරතුරු පළමුවැනි පිටුවෙහි පෙන්නුම් කරයි.



- ඔබ දැනට සිටින ස්ථානය නැවත සිතියම් ගත (re-center) කිරීම සඳහා ඔබට ‘location icon’ ක්ලික් කළ හැක.

- ## Update current rainfall/precipitation levels



- පවත්නා වර්ෂාපතන මට්ටම් යාවත්කාලීන කිරීම සඳහා වර්ෂාපතන අයිකනය ක්ලික් කරන්න. එසේ ක්ලික් කිරීමෙන් අනතුරුව ඔබගේ වර්ෂාමානයේ දැක්වෙන ආකාරයට පැයට මිලීමීටර්වලින් (mm/hr) වර්ෂාපතනය දක්වනු ලබන නව සංවේදකයක් (sensor) ඇතුලත් කර ගැනීමට හැකියාව ලැබෙන තිරය වෙත පිවිසීමට ඔබට හැකි වනු ඇත:

ප්‍රදේශයේ පවත්නා වර්ෂාපතන (‘Current precipitation’) මට්ටම පහත දැක්වෙන ආකාරයට ‘පහළ’, ‘මධ්‍යම’ සහ ‘ඉහළ’ ප්‍රවර්ග අනුව දක්වමින් යාවත්කාලීන කෙරේ :



3.4 මාර්ගෝපදේශිත අවදානම් තක්සේරුව පිළිබඳ (Guided Risk Assessment Questionnaire) ප්‍රශ්නාවලිය වෙත ප්‍රවේශවීම සහ තොරතුරු ඇතුලත් කිරීම



- දැන් ඔබ සූදානම් වන්නේ මෙම මෙවලමෙහි සම්පූර්ණ බලය අනාවරණය කර ගැනීමටයි:එනම් ඔබ විසින් සඳහන් කරන ලද එම නිශ්චිත අවස්ථාව සම්බන්ධයෙන් සකස් කළ නිර්දේශ ලබා ගැනීමටයි. මෙම යෙදවුම තුලට ඔබ විසින් ඇතුලත් කරනු ලබන සියළුම තොරතුරුවල රහස්‍යභාවය සුරැකෙන ආකාරයෙන් මෙම පද්ධතියෙහි සුරක්ෂිතව පවතී.

- මාර්ගෝපදේශිත අවදානම් තක්සේරුව (Guided Risk Assessment) වෙත ප්‍රවේශවීමේ අරමුණින් සිතියම සැඟවීම (hide) සඳහා සිතියමට ඉහළින් දක්වා ඇති කළු තීරුව මත් ක්ලික් කරන්න. එවිට නිර්දේශ (recommendations) දිස් වන අතර මී ළඟ පියවර වෙත යොමුවන්න.

- මි ළඟ තිරයෙහි දැක්වෙන ‘නිර්දේශ ලබාගන්න’ (‘Get Recommendations’)

බොත්තම ක්ලික් කිරීමෙන් අනතුරුව ස්වයංක්‍රීය ප්‍රශ්නාවලිය (automatic questionnaire) දිස්වීම ආරම්භ වනු ඇත. එහි දී දේපළ, යටිතල පහසුකම්, සේවක සේවිකාවන්, සැපයුම්කරුවන්, රක්ෂණ ආවරණ යනා දී විවිධ ප්‍රවර්ග හරහා ඔබගේ ව්‍යාපාරයේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් වෙත යොමු වීමට ඔබට උපදෙස් ලබා දෙනු ඇත



- ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා දීමෙන් අනතුරුව, ඔබ ලබා දුන් පිළිතුරු අනුව ඔබගේ ව්‍යාපාරයට ඇති විය ඇති අවදානම් තත්ත්වයන් (‘Potential risks to your business’) යන්න දිස් වනු ඇත. එහි දී පරිශ්‍රය, ක්‍රියාකාරකම් හා සේවක සේවිකාවන් (‘Premises, Operations and Employees”) අනුව ඇති විය හැකි අවදානම් වර්ගීකරණය කරනු ලැබේ.



- ප්‍රධාන නිර්දේශ (‘’Main Recommendations”) යටතේ දක්වා ඇති ප්‍රවර්ග ක්ලික් කිරීමෙන් ගත යුතු පියවර, මූලාශ්‍ර හා ප්‍රයෝජනවත් සම්බන්ධතා වෙත ප්‍රවේශවීමට පරිශීලකයන්ට හැකි වනු ඇත.

- පහතින් දැක්වෙන්නේ පරිශීලකයන්ට ප්‍රවේශවිය හැකි මූලාශ්‍ර වර්ග ඇතුලත් නියැදියකි.



ඇමුණුම – යෙදවුමට ඇතුලත් කළ යුතු අතිරේක ගුණාංග

- BBCR යෙදවුමේ මුල් ආකෘතිය හඳුන්වාදීමේ දී එහි අන්තර්ගත වන මූලික ගුණාංග කිහිපයක් මෙම මුලාකෘතියට ඇතුලත් කර නොමැත. මෙම ගුණාංග ඇතුලත් කිරීමට පෙර අපේක්ෂිත පරිශීලකයන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීම වැදගත් වේ. නියාමන කණ්ඩායම විසින් BBCR යෙදවුම පිළිබඳ හැඳින්වීමක් අපේක්ෂිත පරිශීලකයන්ට ලබා දීමෙන් අනතුරුව මෙම ප්‍රතිපෝෂණ ලබා ගැනීම ඉතා වැදගත් වන අතර නියාමන ක්‍රියාවලිය තුල දී එම ප්‍රතිපෝෂණ එක් රැස් කර ගනු ලැබේ.
- BBCR යෙදවුමේ මූලාකෘතිය පිළිබඳව පරිශීලකයන් විසින් කිසියම් අවබෝධයක් ලබා ගත් පසු නියාමන කණ්ඩායම විසින් ව්‍යාජ යෙදවුමක් ("dummy App") හා අතිරේක ඇමුණුමක් හඳුන්වාදෙනු ලැබේ. නිර්දේශ හා මූලාශ්‍ර සම්බන්ධ මූලික ගුණාංග පිළිබඳ වැඩි දුර තොරතුරු අපේක්ෂිත පරිශීලකයන්ට ලබා දීම සඳහා මෙය සකස් කර තිබේ. එමෙන්ම අපේක්ෂිත පරිශීලකයාගේ අවශ්‍යතා ඇගයීම මත පදනම්ව ඔවුනට වැදග් වන සම්බනධෙක (links) පිළිබඳ තොරතුරු ද ලබා දීම සඳහා මෙය සකස් කර තිබේ.
- මෙම BBCR යෙදවුමෙහි ඇති ගුණාංග (recommendations and resources) කෙබඳු ස්වරූපයකින් යුක්ත වේද යන්නත් එම ගුණාංග සමග ඔවුන්ට කටයුතු කළ හැකි ආකාරය පිළිබඳව දෘශ්‍ය අදහසක් ලබා ගැනීම සඳහාත් මෙම ව්‍යාජ යෙදවුම ("dummy App") තුලින් අපෙක්ෂිත පරිශිලකයන්ට අවස්ථාව ලැබේ. BBCR යෙදවුම සකස් කර අවසන් කිරීම සඳහා වඩාත් ඉලක්කගත හා අර්ථවත් ප්‍රතිපෝෂණ ලබා දීමට අපේක්ෂිත පරිශීලකයන්ට මෙමගින් අවස්ථාව උදා වනු ඇත.
- අතිරේක ගුණාංග පිළිබඳ සාරාංශයක් ප්‍රධාන පරිශීලක අත්පොතට ඇතුලත් කර ඇති මෙම ඇමුණුමෙහි දක්වා ඇත.පහත දැක්වෙන සම්බන්ධකය හරහා පරිශීලකයන්ට එයට ප්‍රවේශ වීමටත් එම අතිරේක ගුණාංග පිළිබඳව තොරතුරු ලබා ගැනීමටත් හැකියාව තිබේ. https://rebrand.ly/bbcr-invision

- මූලාශ්‍ර: වෙනම කවළුවකින් (window) විවෘත වන බහු මූලාශ්‍ර ලබා ගැනීම සඳහා පරිශීලකයාට නිර්දේශයක් (Recommendation) ක්ලික් කිරීම තුලින් සම්බන්ධක සහිත පහළට ගමන් කරන වරණයක් (drop- down menu) විවෘත කර ගත හැක





- තමා කැමති නිර්දේශ (‘Favourite’ Recommendations) තෝරා ගැනීම : තිරය මත දැක්වෙන නිර්දේශයක් දකුණු පැත්තට (swiping) තල්ලු කිරීමෙන් තමා කැමති ("favourite") නිර්දේශයක් ලබා ගැනීමට පරිශීලකයාට හැකියාව තිබේ. තමාගේ කැමැත්ත පරිදි තෝරා ගත් නිර්දේශයක්

  සලකුණින් දැක්වෙනු ඇත.



- නිර්දේශයක් (recommendation) තෝරා ගැනීම අවසන් කිරීම: පරිශීලකයා විසින් නිර්දේශයක් තෝරා ගැනීම ආරම්භ කළ පසු තිරය මත දැක්වෙන නිර්දේශ වම් පසට තල්ලු කිරීමෙන් නිර්දේශ තව දුරටත් පරීක්ෂා කිරීම අවසන් කළ හැක. තමා කැමති නිර්දේශයක් සඳහා කැමැත්ත ලබා දීම තුළින් (“favouriting”) මෙම ගුණාංගය වෙත පිවිසීමට පරිශීලකයාට හැකියාව තිබේ. තෝරා අවසන් කරන ලද (“completed”) නිර්දේශයක් ලකුණින් දිස් වනු ඇත.



- හදිසි දුරකථන අංක (Emergency numbers): තිරයේ ඉහළින් දැක්වෙන මෙම තුරු ඇඟවීමේ අයිකනය ක්ලික් කිරීමෙන් හදිසි දුරකථන අංක සහිත වෙනමම තිරයක් (window) දිස්වනු ඇත. එමගින් ඔබට ක්ෂණික දුරකථන ඇමතුම් ලබා ගත හැකි වනු ඇත.



ව්‍යාපාර කටයුතුවලදී දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ (BBCR) ව්‍යාපෘතිය පිළිබඳව:

ජලගැලීම් ඇති වන අවස්ථාවල දී, තම ව්‍යාපාරවලට සිදු විය හැකි හානිය නැවත නැවත ඇති වීම අවම කර ගැනීම සඳහාත් එවැනි ව්‍යසනකාරී අවස්ථාවල දි තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් ශ්‍රී ලංකාව තුල කුඩා ව්‍යාපාරිකයන්ට අවස්ථාව ලබා දෙන්නා වූ ආපදා අවදානම් කළමණාකරණයක් සහ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යෑමේ මෙවලමක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පියවර සකස් කිරීමේ අරමුණින් නෝර්ඩික් දේශගුණික පහසුකම (Nordic Climate Facility) (NCF), එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන - ඩැනිෂ් තාක්ෂණික සරසවි හවුල්කාරීත්වය (United Nations Environment Programme - Technical University of Denmark (UNEP- DTU) Partnership, ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC), ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (CCC) සහ MPEnsystems යන ආයතනයවල සහයෝගීත්වයෙන් යුතු මූලායතන සමූහයක් නිර්මාණය කරන ලදි. අදාළ සහයෝගය/සේවා සපයනු ලබන සංවිධානවලට මෙම නිෂ්පාදනය අදාළ වන්නේ ද යන්න තහවුරු කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රමුඛ රාජ්‍ය නියෝජිත ආයතනය සහ මූලායතන නියෝජිතයන්ගෙන් සමන්විත ව්‍යාපෘති ආශ්‍රේය කණ්ඩායම් (PRG) මෙහෙයවනු ලබන කර්මාන්ත හා සැපයුම් ජාල කළමනාකරණ අමාත්‍යාංශය සමග මනා සහයෝගීත්වයෙනි.

අධාර ලබා දෙන ආයතන:

නෝර්ඩික් දේශගුණික පහසුකම Nordic Climate Facility (NCF) යනු නවෝත්පාදක දේශගුණික වෙනස්කම් ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ආයතනයකි. නෝර්ඩික් දේශගුණික පහසුකම (NCF) විසින් අරමුදල් වෙන් කරනු ලබන්නේ වාර්ෂිකව සකස් කරනු ලබන යෝජනා සඳහා කැඳවීම් සිදු කරමින් තරඟකාරීත්ව පදනමක් අනුගමනය කරමිනි. නෝර්ඩික් දේශගුණික පහසුකම (NCF) වෙත අරමුදල් සපයනු ලබන්නේ නෝර්ඩික් රටවල් මගින් ස්ථාපිත කර ඇති ජාත්‍යන්තර සංවර්ධන සහ දේශගුණික මූල්‍ය ආයතනයක් වන නෝර්ඩික් සංවර්ධන අරමුදල (NDF) මගිනි.

Implemented by: